# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1915/42 - 2015 මැයි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2015.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන*ඉඩමේ/පරවශතාවේ විස්තර*:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැනුම්පති විසින් පිළියෙලකර සකස් කර ඇති අංක 4103 හා 2015.02.11 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.8555 ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 01**

ඉඩමේ නම: කොහිලවතුර; විස්තරය: ගෙවත්ත, අවු. 40ක් පමණ වයසැති පොල් ගස් 12ක්, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වැසිකිළි 4ක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සභාපති ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 ජූලි මස 23 වැනි දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කරන්දෙණියේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2015 ජූලි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු යි.

අයි. එස්. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
කරන්දෙණිය.

2015 මැයි මස 18 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 154

---

### ශුද්ධි පත්‍රිකාව

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: KDS/KGK4-2(2) 2014/05.

උක්ත ශීර්ෂ යටතේ අංක 1908/31 හා 2015.04.01 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු කොටස* | *සංශෝධනය කළ යුතු කොටස* |
|---|---|
| 2015 අප්‍රේල් 30 | 2015 ජූනි 10 |
| 2015 අප්‍රේල් 23 | 2015 ජූනි 03 |

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය.

2015 මැයි මස 19 වැනි දින,
මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 155